293

RARE

# පාසල් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කරගැනීමේ ලා පාසල් පුස්තකාල සේවාවන් සංවිධානය විය යුතු ආකාරය පිළිබඳ ක්‍රියා මාර්ග හා උපාය මාර්ග අධ්‍යයනය කිරීම
## (ගම්පහ දිස්ත්‍රික්කය ආශ්‍රිතව)

කැළණිය විශ්ව විද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ
පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති
පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදි.

| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 293 |
| වර්ග අංකය | |

**තමරා කුමාරි අබේගුණරත්න**

භූගෝල විද්‍යා (විශේෂ) උපාධි, අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමා (සම්මාන),
පුස්තකාල හා විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමා

2002 අගෝස්තු

# සංක්ෂිප්තය

ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාලයන්හි ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්වය පිළිබඳ අධ්‍යයනයක් කරමින් එහි සේවාවන් සංවර්ධනය විය යුතු ආකාරය හඳුන්වා දීම අරමුණු කර ගෙන එක් අධ්‍යාපන මෙන්ම පරිපාලන දිස්ත්‍රික්කයක් වන ගම්පහ දිස්ත්‍රික්කය ඇසුරින් මෙම පර්යේෂණය සිදු කරන ලදී. ඒ අනුව මෙහි මාතෘකාව වූයේ "පාසල් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කරගැනීමේ ලා පාසල් පුස්තකාල සේවාවන් සංවිධානය විය යුතු ආකාරය පිළිබඳව ගත හැකි ක්‍රියා මාර්ග හා උපාය මාර්ග අධ්‍යයන කිරීම (ගම්පහ දිස්ත්‍රික්කය ආශ්‍රිතව)" යනුවෙනි.

බස්නාහිර පළාතේ පරිපාලන දිස්ත්‍රික්කයක් වන ගම්පහ දිස්ත්‍රික්කය නාගරික, අර්ධ නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රදේශ වලින් ද සමන්විත වී ඇති බව පෙනෙන්නට තිබිණි. එහෙයින් මෙම දිස්ත්‍රික්කය ආශ්‍රිතව කරනු ලබන පර්යේෂණයකින් ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල පිළිබඳ පුළුල් අධ්‍යයන පැතිකඩක් ආවරණය වනු ඇතැයි අපේක්ෂා කරන ලදී. මෙම ප්‍රදේශයේ පාසල් පුස්තකාල ආශ්‍රිතව මීට පෙර පුළුල් පර්යේෂණාත්මක අධ්‍යයනයක් සිදු වූ බවට වාර්තා වී නොතිබීමත් , ශ්‍රී ලංකාවේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වල නියාමක ව්‍යාපෘතීන් මෙම දිස්ත්‍රික්කය ආශ්‍රිතව ක්‍රියාත්මක වෙමින් පැවැතීමත් මෙම මාතෘකාව තෝරා ගැනීමට පර්යේෂකයා පෙළඹ වූ කරුණු වේ.

ගම්පහ දිස්ත්‍රික්කය තුළ පාසල් පුස්තකාල, සම්පත් පාදක ඉගෙනුම යටතේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා කෙසේ දායක වේද? ඒ සඳහා ගත හැකි සක්‍රිය ක්‍රියා මාර්ග කවරේද? ඒවා සපුරා ගැනීමට භෞතික සම්පත් උපරිම අයුරින් යොදා ගන්නේ කෙසේද? භෞතික සම්පත් ගලා යෑමේ තිබෙන්නාවූ විෂමතාවයන් මොනවාද? ලෝක බැංකු ව්‍යාපෘතිය පාසල් පුස්තකාල සංවර්ධන කටයුතු සඳහා සහාය වී ඇත්තේ කෙසේද? යන කරුණු මෙහිදී අධ්‍යයනයට භාජනය කරන ලදී.

දත්ත රැස්කිරීම ප්‍රධාන වශයෙන් ප්‍රශ්ණාවලි හා සම්මුඛ සාකච්ජා මගින් සිදුවිය. ඊට අමතරව ප්‍රලේඛන ගවේශණය සහ නිරීක්ෂණ චාරිකා මගින් ද අවශ්‍ය තොරතුරු ලබා ගන්නා ලදී. ගම්පහ දිස්ත්‍රික්කයේ මුළු පාසල් පුස්තකාල ප්‍රමාණය 233 ක් බවට වාර්තා විය. ඉන් 25% ක් එනම් පාසල් වර්ගීකරණයට සමානුපාතිකව තෝරා ගන්නා ලද පාසල් පුස්තකාල 58 ක් වෙත තැපැල් මාර්ගිකව යවන ලද ප්‍රශ්ණාවලියට පාසල් 40 කින් ප්‍රතිචාර ලැබිණි. ප්‍රතිචාර ලැබූ පාසල් පුස්තකාල වලින් 10% ක් නිරීක්ෂණ චාරිකා සඳහා තෝරා ගනු ලැබූ අතර මේ පාසල් වල විදුහල්පතිවරුන්, පුස්තකාලයාධිපති වරුන් මෙන්ම ද්විතීය ශ්‍රේණිවල ගුරු භවතුන් හා සිසුන්ද සමඟ පැවැති සම්මුඛ සාකච්ජා මාර්ගයෙන් තව දුරටත් තොරතුරු ලබා ගන්නා ලදී.

ගම්පහ දිස්ත්‍රික්කයේ පාසල් පුස්තකාල පිළිබඳ ප්‍රකාශිත ප්‍රලේඛන ගවේශනයේදී ප්‍රමාණවත් මුද්‍රිත ලේඛන සොයා ගැනීම අසීරු විය. එහෙත් ලෝක බැංකු ව්‍යාපෘති වාර්තා හා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා මෙම අධ්‍යයනය සඳහා බෙහෙවින් පාදක කර ගත හැකි විය.

පාසල් පුස්තකාල වල දැනුම් ද්‍රව්‍ය එකතුව සංවිධානය, සංසරණය සහ සංරක්ෂණය මෙන්ම පුස්තකාල කාර්ය මණ්ඩලයේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පුහුණුව යන ප්‍රධාන මාතෘකා අනුව දත්ත එක්රැස් කිරීම හා දත්ත විශ්ලේෂණය සිදුවිය. දත්ත විශ්ලේෂණය සඳහා උපයෝගී කරගනු ලැබූ සංඛ්‍යාත්මක ඇමුණුම් අදාල මාතෘකා සමඟ අංක 1 සිට ඇමුණුම් අංක 6 දක්වා ඉදිරිපත් කර ඇත.

දත්ත විශ්ලේෂණයේදී හා ප්‍රලේඛන පරිශීලනයේදී මෙන්ම සම්මුඛ සාකච්ඡා අනුව ලබා ගත හැකි නිර්දේශ ප්‍රධාන වශයෙන් භෞතික, මානව හා මූල්‍ය සම්පත් හා සේවා සංවිධානය යන අංශ යටතේ සිදු විය. මෙහිදී පාසල් පුස්තකාලයක් සඳහා සුදුසු පරිසරයක් සහිත ගොඩනැගිල්ලක් දැකිය නොහැකි වූ අවස්ථා තිබූ අතර පුස්තකාල ලී බඩු හා අනෙකුත් උපකරණ සැපයීමද ප්‍රමාණවත් නොවිණි. ප්‍රමාණවත් පුටු මේස ලැබී තිබුණු අවස්ථාවක පවා ඒවා සිසුන්ගේ පුස්තකාල පරිහරණය සඳහා සුදුසු තත්වයක නොතිබිණි. පාසල් පුස්තකාල තුළ දැනට පවතින තොරතුරු හා දැනුම් ද්‍රව්‍ය, තිබිය යුතු තත්වය හා සසඳන විට විශාල වෙනසක් දැකිය හැකි විය. මේ හැරුණු විට පාසල් පුස්තකාල විෂය ක්ෂේත්‍රය තුළ මූල්‍ය සම්පත් පිළිබඳ සාකච්ඡා කිරීමට තරම් ප්‍රමාණවත් තොරතුරු සපයා ගත හැකි නොවිණි. මේ අනුව ගම්පහ දිස්ත්‍රික්කය ආශ්‍රිතව ලබාගත් මෙම සමීක්ෂණ තොරතුරු වලින් අනාවරණය වූ කරුණු පොදුවේ මුළු දිවයිනේම පාසල් පුස්තකාලවල තිබෙන සම්පත් හා සේවා තත්වය පිළිබඳ හඳුනා ගැනීමක් ද වනු ඇත.

21 වන සියවස සඳහාවූ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ බිහිවෙමින් පවතින යුගයක ඊට අනුරූපව රටේ පාසල් පුස්තකාල පද්ධතියද ඉගෙනුම් - ඉගැන්වීම් කාර්යයේ ඵලදායිතාවය උදෙසා සංවර්ධනාත්මක නව මුහුණුවරකින් සංවිධානය වී තිබිය යුතුය. ඒ සඳහා ප්‍රමිතීන්ට අනුව පුස්තකාල වෙනුවෙන් භෞතික සම්පත් ලබාදීම, නව විඥාපන තාක්ෂණ නැඹුරුව හා ඊට සමගාමීව අවශ්‍ය කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය මෙන්ම ඒවායේ ක්‍රමවත් බව උදෙසා පාසල් පුස්තකාල පිළිබඳ රජයේ ප්‍රතිපත්තියක අවශ්‍යතාවය යන කරුණු කෙරෙහි බලධාරීන්ගේ අවධානයට යොමු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල පිළිබඳ ජාතික මට්ටමින් සැලසුම් සකස් කිරීමේදී මෙම පර්යේෂණයෙන් ලබා ගත් නිර්දේශ හා නිගමන බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත.

2002

තමරා කුමාරි අබේගුණරත්න
පර්යේෂක